# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023.02.28 |


## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2023 පෙබරවාරි මාසයේ දී පහළ ගියේය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 51.7හි සිට 2023 පෙබරවාරි මාසයේ දී සියයට 50.6 දක්වා පහළ ගියේය. මතුපිට උද්ධමනයේ මෙම පහළ යෑම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 ජනවාරි මාසයේ දී අපේක්ෂා කරන ලද උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවට බොහෝ දුරට අනුකූල වේ.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2023 ජනවාරි | 2023 පෙබරවාරි |
|---|---|---|
| දර්ශක අගය | 188.6 | 189.5 |
| මාසික වෙනස (%) | 0.5 | 0.5 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 51.7 | 50.6 |

ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2023 ජනවාරි මාසයේ පැවති සියයට 60.0හි සිට 2023 පෙබරවාරි මාසයේ දී සියයට 54.4 දක්වා පහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2023 ජනවාරි මාසයේ පැවති සියයට 47.9හි සිට 2023 පෙබරවාරි මාසයේ දී සියයට 48.8 දක්වා ඉහළ ගියේය. 2023 පෙබරවාරි මාසයේ දී කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස, සියයට 0.47ක් ලෙස වාර්තා විය. මෙයට ප්‍රධාන වශයෙන් දායක වූයේ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි මාසිකව ඉහළ යෑම වන අතර, එම දායකත්වය සියයට 1.20ක් විය. කෙසේ වුවද, 2023 පෙබරවාරි මාසයේ දී ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මාසිකව සියයට 0.74කින් පහළ ගියේය. ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2023 ජනවාරි මාසයේ පැවති සියයට 45.6හි සිට 2023 පෙබරවාරි මාසයේ දී සියයට 43.6 දක්වා පහළ ගියේය.

**කො.පා.මි.ද. (2021=100) මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




ශ්‍රී ලංකා මහ බැංකුවේ නවතම සාර්ව ආර්ථික පුරෝකථන අනුව, දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් යටපත් වූ ඉල්ලුම් තත්ත්වයන් සහ දේශීය සැපයුම් තත්ත්වයන්හි අපේක්ෂිත වැඩිදියුණු වීම් මෙන්ම හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම මගින් සහාය ලබමින් උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාව 2023 වසර පුරා අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන[2]**

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %)**




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන් සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිත බව සාමාන්‍ය කාලයන්ට වඩා බෙහෙවින් ඉහළ වේ. විශේෂයෙන්ම, මෑත කාලීන විදුලි ගාස්තු වැඩිවීම මගින් ඇතිවිය හැකි වක්‍ර බලපෑම්, අනෙකුත් උපයෝගිතා සහ බලශක්ති මිලෙහි යම් ඉහළ යෑම්, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියේ සිදු විය හැකි වෙනස්වීම් යනාදිය හේතුවෙන් අපේක්ෂිත උද්ධමනය ඉහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය. කෙසේ වෙතත්, ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව අඩු වීම මගින් ඉහළ උද්ධමන පීඩන මර්දනය විය හැකි අතර එමගින් අපේක්ෂිත උද්ධමනය පහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය.

***මූලය**: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

[1] 2023 පෙබරවාරි මාසයේ සිට කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) සම්පාදනය කිරීම අත්හිටුවා ඒ වෙනුවට කො.පා.මි.ද., (2021=100) ආදේශ කර ඇත. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

[2] මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් පවතින දත්ත සහ 2023 වසරේ ජනවාරි මාසයේ පුරෝකථන වාරයේ දී සිදු කරන ලද උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ. මෙහි රතු පැහැති තිත් මගින් දක්වා ඇති වාර්තා වූ උද්ධමන සංඛ්‍යා නව පදනම් වර්ෂය (කො. පා. මි. ද., 2021=100) මත පදනම් වන අතර, උද්ධමන ව්‍යාප්ති සටහන සහ පසුගිය දත්ත පැරණි පදනම් වර්ෂය (කො. පා. මි. ද., 2013=100) මත පදනම් වේ. එබැවින්, උද්ධමන ව්‍යාප්ති සටහන මගින් දක්වා ඇති පුරෝකථනවලට සාපේක්ෂව එම උද්ධමන සංඛ්‍යාවල පැහැදිලි වෙනසක් දැකිය හැකිය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු නිකුත් කිරීමත් සමගම මහ බැංකුව එහි මැදි කාලීන ආර්ථික පුරෝකථන කාර්තුමය පදනමින් සංශෝධනය කරයි. ඒ අනුව, 2022 සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ දත්ත සහ නව පදනම් වර්ෂය මත පදනම් වූ උද්ධමනය ඇතුළුව පවතින නවතම තොරතුරු භාවිතා කරමින් 2023 අප්‍රේල් පුරෝකථන වටයේදී උද්ධමන ව්‍යාප්ති සටහන යාවත්කාලීන කෙරෙනු ඇත.

### උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය
### (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2022 | ජනවාරි | 124.3 | 118.4 | - | - | - | - |
| | පෙබරවාරි | 125.8 | 120.0 | 1.2 | 1.4 | - | - |
| | මාර්තු | 129.7 | 123.6 | 3.1 | 3.0 | - | - |
| | අප්‍රේල් | 142.1 | 134.2 | 9.6 | 8.6 | - | - |
| | මැයි | 153.6 | 142.2 | 8.1 | 6.0 | - | - |
| | ජූනි | 171.7 | 154.7 | 11.8 | 8.8 | - | - |
| | ජූලි | 178.9 | 160.9 | 4.2 | 4.0 | - | - |
| | අගෝස්තු | 182.8 | 163.6 | 2.2 | 1.7 | - | - |
| | සැප්තැම්බර් | 189.3 | 168.8 | 3.6 | 3.2 | - | - |
| | ඔක්තෝබර් | 188.5 | 170.4 | -0.4 | 0.9 | - | - |
| | නොවැම්බර් | 187.1 | 171.1 | -0.7 | 0.4 | - | - |
| | දෙසැම්බර් | 187.6 | 171.5 | 0.3 | 0.2 | - | - |
| 2023 | ජනවාරි | 188.6 | 172.4 | 0.5 | 0.5 | 51.7 | 45.6 |
| | පෙබරවාරි | 189.5 | 172.3 | 0.5 | -0.1 | 50.6 | 43.6 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව